# ඤලං මාමා



කේ.ඒ.කවිදු නිම්සර

# හුලං මාමා

කෘතියේ නම : හුලං මාමා

කතෘගේ නම : කේ.ඒ. කවිදු නිම්සර (පළමු දිගහැරුම)

පාසල : මහ/සිද්ධාර්ථ මහ විද්‍යාලය

පන්තිය : 06 ශ්‍රේණිය

කෘතිය පළ කරන දිනය : 2025-02-08

ISBN අංකය : IS38148

# පිදුම

මා විසින් රචනා කළ මෙම පළමු කෘතිය සෙනෙහෙබර සිතින් මාගේ ආරණීය දෙමව්පියන්ටත්, සොහොයුරිටත් පුද කරන අතර මා අධ්‍යාපන කටයුතු හදාරන මහ/සිද්ධාර්ථ මහා විද්‍යාලයට මෙන්ම හෙරන ගත්කරණීය ව්‍යාපෘතිය හඳුන්වා දුන් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු මේ සඳහා දායකත්වය ලබා දුන් සංවිධායක මණ්ඩලයට බැති සිතින් මෙම නිර්මාණය පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



අහසේ ලස්සන සරුංගල් පාවෙනවා. මටත් හිතුනා සරුංගලයක් හදන්න, ඒත් මම සරුංගල් හදන්න දන්නේ නෑනේ, හොඳ වෙලාවට මට උදව් කරන්න තාත්තා ආවා.

තාත්තා බට පතුරුවලින් මට සරුංගල් පට්ටමක් හදලා දුන්නා. පාට කොළ අලවා, රැලි කපලා, වරල් දමලා සරුංගලය හැඩ කලා.



ඔන්න දැන් මට ලස්සන සරුංගලයක් තියෙනවා. දැන් තියෙන්නේ සරුංගලය උඩ යවන්න. ඒත් කොහොමද මම ඒක කරන්නේ. එතකොටම '' ඔයාට මං උදව් කරන්නම්'' කියනවා මට ඇසුණා.



මම ටිකක් බයවුණා. ''කවුද ඔයා? මට ඔයාව පේන්නේ නැහැනේ'' මම කිව්වා. මං තමයි හුළං මාමා. මාව පේන්නේ නැති වුනාට මං ඉන්න බව ඔයාගේ ඇඟට දැනෙනවනේ.



ඒ වගේම මම ගස්වල අතු හොලවනකොට හැමෝම දන්නවා මං ඉන්න විත්තිය. හුළං මාමා කිවුවා. ඒ වුනාට ඔයා කරන්නේ දඟ වැඩනේ. කුණාටුවක් වගේ ඇවිත් ලොකු ගස් පෙරළනවා. වහලවල් ගලවා ඈතට විසිකරනවා, මුහුදු රළ සැර කරලා බෝට්ටු පෙරලනවා.



ඒවා දැඟවැඩ නෙමෙයිද මාමේ? මම ඇහුවා. ආ... ඉඳලා හිටලා කේන්ති ගියාම මං එහෙම කරනවා තමයි. ඒත් ඊට වඩා මම ඔයාලට ගොඩාක් උදව් කරනවා. ඔන්න අහගන්නකෝ.






ඔයාලගේ සරුංගල් අහසට ගෙනියන්නේ මං තමයි. රස්නේ වෙලාවට සිසිලස ගෙනදෙන්නත්, තෙත රෙදි වේලන්නත් මට පුළුවන්. සමහර ගස්වල ඇට ඈත තැනකට පැළ කරන්න අරගෙන යනවා වගේම මුහුදේ රැවල් ඔරු පා කරවන්නත් මට පුළුවන්.



ඉස්සර ගොවි මාමලා වී වල රොඩු ඉවත් කරෙත් මගේ උදව්වෙන් තමයි. ඒ විතරක් නෙවෙයි අහසේ වළාකුළු පා කරලා රට වටේටම වැස්ස අරන් යනවා වගේම, රෑංපෙත්ත කරකවලා ලයිට් පත්තු කරන්නත් මට පුළුවන්.

ඔයාලගේ රටේ දැනටමත් මගේ උදව්වෙන් විදුලිබලය නිපදවෙනවා. ඒ අතරින් විදුලිය නිපදවෙන ලොකුම විදුලිබලාගාරය තියෙන්නේ මන්නාරමේ. මං ඒ එක රෑංපෙත්තක් එක වටයක් කැරකෙවුවම දවසකට එක ගෙදරකට ඕන කරන විදුලිය නිපදවෙනවා, හුළං මාමා හරිම ආඩම්බරයෙන් කිව්වා.



**කොච්චර ලොකු සේවයක්ද ? හරි පුදුමයි. මාත් ආසයි ලොකු වෙලා විදුලි බලාගාරයක් හදන්න මම කිව්වා. ''බොහොම හොඳයි'' මම ඒ විදුලි බලාගාරයේ රූංපෙත්ත කරකවන්න ආසාවෙන් බලන් ඉන්නවා.'' හුළං මාමා කිව්වා.**





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දූරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

**ISBN : IS38148**